Department of Education,Sabaragamuwa Province/ Weekly School



සකස් කළේ - ඒ.එම්.තුසිතා රත්නායක
මිය,ර/කිරිඇල්ල ම.ම.වි.

නිපුණතාව 1.0 - ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

නිපුණතා මට්ටම 1.3 - විවිධ නිර්ණායක මත ව්‍යාපාර වර්ග කරයි.

## ව්‍යාපාර වර්ගීකරණය

ව්‍යාපාර පහත නිර්ණායක මත වර්ගීකරණය කළ හැක.

1.නිෂ්පාදනයේ ස්වභාවය අනුව 2.හිමිකාරීත්වය අනුව 3.අරමුණ අනුව 4.පරිමාණය අනුව 5.නිෂ්පාදන අංශය අනුව

ව්‍යාපාර වර්ගීකරණ පදනම් හා ඒ අනුව වර්ග කරන ආකාරය පහත පරිදි දැක්විය හැක.

1.නිෂ්පාදනයේ ස්වභාවය අනුව ව්‍යාපාර කොටස් තුනකි.
1.ප්‍රාථමික අංශය 2.ද්විතීයික අංශය 3.තෘතීයික අංශය

2.හිමිකාරීත්වය අනුව ව්‍යාපාර කොටස් 2කි.
1.පෞද්ගලික අංශය 2.රාජ්‍ය/පොදු අංශය

3.අරමුණ අනුව ව්‍යාපාර කොටස් දෙකකි.
1.ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර 2.ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර

4.පරිමාණය අනුව ව්‍යාපාර කොටස් දෙකකි.
1.සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 2.මහා පරිමාණ ව්‍යාපාර

5.නිෂ්පාදන අංශය අනුව ව්‍යාපාර කොටස් තුනකි.
1.කෘෂිකාර්මික ව්‍යාපාර 2.කාර්මික ව්‍යාපාර 3.සේවා ව්‍යාපාර

**දළ දේශීය නිෂ්පාදිතය -** රටක ආර්ථික සංවර්ධනයේදී කෘෂිකාර්මික,කාර්මික හා සේවා යන අංශ තුනෙන් ප්‍රතිශතයක් ලෙස නිෂ්පාදිතයට එකතු කරන නිෂ්පාදිත ප්‍රමාණයන් දළ දේශීය නිෂ්පාදිතය වේ.ආර්ථිකයක නිෂ්පාදන කටයුතු සියල්ල දළ දේශීය නිෂ්පාදිතයෙන් දැක්වේ.

## අභ්‍යාස

ඔබ ප්‍රදේශයේ ඇති ව්‍යාපාර 10ක් නම් කර ඒ ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.(අදාළ ස්ථානයට හරි ලකුණ යොදන්න.)

| ව්‍යාපාරයේ නම | නිෂ්පාදනයේ ස්වභාවය | | | හිමිකාරීත්වය අනුව | | අරමුණ අනුව | | පරිමාණය අනුව | | නිෂ්පාදන අංශය අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාථමික | ද්විතීයික | තෘතීයික | පෞද්ගලික | රාජ්‍ය/ පොදු | ලාභ අරමුණු කර ගත් | ලාභ අරමුණු කර නොගත් | සුළු හා මධ්‍ය පරිමාණ | මහා පරිමාණ | කෘෂිකාර්මික | කාර්මික | සේවා |
| | | | | | | | | | | | | |